# සංඛ්‍යාංක තාක්ෂණය ඔස්සේ පුස්කොළ පොත් සංරක්ෂණය

ඩබ්ලිව්. එම්. හිරාන් මදුසංක[1]

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් ලේඛන කලාවේ ඉතිහාසය සාහිත්‍ය මූලාශ්‍රයට අනුව ක්‍රි.ව සවන සියවස දක්වා වූ අතීතයකට දිව යයි. මහින්දාගමනයත් ඒ තුළින් ලැබූ සංස්කෘතික පුනර්ජීවනයත් සමඟ මෙය තව දුරටත් ප්‍රවර්ධනය විය. ක්‍රි.පූ පළමුවෙනි සියවස දක්වා ත්‍රිපිටකය සහ අට්ඨකථා සහිත වූ දැනුම් සම්භාරයත් පැවත ආ මාධ්‍ය වූයේ මුඛ පරම්පරාව යි. භික්ෂු සමාජය තුළ හොඳින් සංවිධාන ගත වූ මේ මුඛ පරම්පරා විසින් මේ දැනුම පවත්වාගෙන ආ අතර විවිධ විෂයන්ට අයත් බෞද්ධාගමික හෝ එසේ නොවන ඥාණ සම්භාරයන් ද පරම්පරාවෙන් ම පවත්වාගෙන එනු ලැබීය. මේ ආකාරයට මුඛ පරම්පරාගතව දැනුම පවත්වාගෙන ඒම ප්‍රධාන කරගත් මෙරට දැනුම් සංරක්ෂණය ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමත් සමඟ නව මාවතකට යොමු විය. ඒ අනුව ත්‍රිපිටකය අට්ඨකථා සේම වෙනත් දැනුම් සම්භාරයන්ද ක්‍රමිකව ග්‍රන්ථකරණයකට පරිවර්තනය විය. මේ ආකාරයට ග්‍රන්ථකරණය මාධ්‍ය කොට ගෙන දැනුම පවත්වාගෙන යාමට නොයෙකුත් දේශපාලන ආර්ථික ආගමික හා බුද්ධිමය කරුණු බලපාන ලදී. මේ ග්‍රන්ථකරණය සඳහා ප්‍රධානතම මාධ්‍යය කොට ගත්තේ පුස්කොළය. මේ පුස්කොළ පොත් නැවත නැවත පිටපත් කරමින් වෙහෙර විහාරස්ථාන වල පොත්ගුල් තුළ තැන්පත් විය. එලෙස තැන්පත් කරන ලද පුස්කොළ පොත් සංරක්ෂණය කළ සාම්ප්‍රධායික විධික්‍රමද රැසක් විය. පුස්කොළ පොත් භෞතික සංරක්ෂණය හා අන්තර්ගත සංරක්ෂණය යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකි. භෞතික සංරක්ෂණයෙන් සිදු කෙරෙනුයේ පුස්කොළ පොත් ස්භාවික විනාශයන්ගෙන් හා කෘමි හානි ආදීයෙන් වළක්වා ගැනීම හා ඒවායේ භෞතික පැවැත්ම තහවුරු කිරීමයි. අන්තර්ගතය සංරක්ෂණය කිරීමෙන් සිදු වන්නේ පුස්කොළ පොත් හි අන්තර්ගත වූ දැනුම් සම්භාරය සංරක්ෂණය කිරීමයි. මේ සඳහා එදා මෙදා තුර පුස්කොළ පොත් සංරක්ෂණයෙහිලා ක්‍රම රාශියක් භාවිත කෙරිණි. ඒ අතර නූතනයේ එම ක්‍රම ලෙසින් සූක්ෂ්ම ඡායා පිටපත්තරණ පරිලෝකණය (scan) ආදි වූ ක්‍රමයන් භාවිත කර තිබේ. ඒ අතර වන නූතන ක්‍රමවේදයක් ලෙසින් සංඛ්‍යාංක තාක්ෂණය ( Digital Copyright ) ඔස්සේ පුස්කොළ පොත් සංරක්ෂණය හඳුන්වා දිය හැකිය.

---

[1] පුස්කොළ පොත් අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාලය, කැලණිය විශ්වවිද්‍යාලය.
hiran6361@gmail.com

## ආශ්‍රිත ග්‍රන්ථ

මෙම පර්යේෂණයේදී උපයෝගි කරගත් මූලාශ්‍රමය ග්‍රන්ථ ලෙසින් ආරිය ලගමුව මහතාගේ ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් ලේඛණ කලාව යන ග්‍රන්ථය, ලංකාවේ අධ්‍යාපනය, (අධ්‍යාපන සියවස ග්‍රන්ථය) දීපාංජනී ඇල්ලෙපොල මහත්මියගේ තල්පත් ලිවීම යනාදී ග්‍රන්ථයන් ද උපයෝගී කරගත් අතර තවද මේ පිලිබඳව අධ්‍යයනය කිරීමටත් මෙහි පසුබිම විමසීමටත් ආනන්ද කුමාරස්වාමි මහතාගේ මධ්‍යකාලීන සිංහල කලා ග්‍රන්ථය, රැල්ෆ් පීරිස් මහතාගේ සිංහල සමාජ සංවිධානය, ග්‍රන්ථයත් මෙන්ම වල්පොළ රාහුල හිමිගේ ලක්දිව බුදුසමයේ ඉතිහාසය යන ග්‍රන්ථද උපයෝගි කර ගන්නා ලදී. මේ මගින් අදාළ විෂය පථයත් ඉන් පරිබාහිර පසුබිමත් නිරීක්ෂණය වේ.

## ක්‍රමවේදය

අතීතයේ දී සංරක්ෂණය සඳහා භාවිතා කළ ක්‍රමවේදයන්ට වඩා පුස්කොළ පොත් සංරක්ෂණයෙහි ලා සංඛ්‍යාංක තාක්ෂණය භාවිතය වඩාත් ප්‍රායෝගික හා පහසුදායි ක්‍රමයක් වී තිබේ. මීට ප්‍රධානතම හේතුව නම් අඩු සම්පත් ප්‍රමාණයකින් පුස්කොළ පොත්හි අන්තර්ගතය මෙන්ම ඒවායේ පවත්නා වූ සියුම් දත්තයන් ඒකරාශි කර ගැනීමට හැකිවීම යි. මේ සඳහා මා විසින් යොදා ගත් ක්‍රමවේදය නම් අප විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ පුස්කොළ පොත් අධ්‍යයන හා පර්යේෂණ පුස්තකාලයේ පුස්කොළ පොත් සංරක්ෂණය කිරීමේ ක්‍රමවේදයයි. එහිදී පුස්තකාලය තුළින් හා ඉන් පරිබාහිරව එනම් පුස්කොළ පොත් එකතුන් සහිත වූ විහාරස්ථාන හා පුද්ගල සන්තකව ඇති පෞද්ගලික එකතුන් වෙත ගොස් මෙකී නවීන තාක්ෂණය ඔස්සේ තාක්ෂණික උපාංග මඟින් මෙම පිටපත්කරණ ක්‍රියාවලිය සිදු කෙරේ. මේ සඳහා මුලින්ම ග්‍රන්ථ විද්‍යාත්මක අධ්‍යයනයක් සිදු කිරීම අනිවාර්යයෙන්ම සිදු කරනු ලබයි. ඒ මඟින් සිදු කරනු ලබන්නේ ග්‍රන්ථ වර්ගීකරණයයි. මේ සමගම එම ග්‍රන්ථයන්හි වෙනම ම වූ නාම ලේඛණයක් ද තබා ගැනීමත් විශේෂයෙන්ම සිදු කරන්නා වූ කාර්යයෙකි.

## ප්‍රතිඵල

පුස්කොළ පොත් සංඛ්‍යාංක තාක්ෂණය ඔස්සේ සංරක්ෂණය කරන මේ ක්‍රමය මගින් ඒ පිළිබඳව අධ්‍යයනය නරන්නා වූ විද්‍යාර්ථීන්ටත් පර්යේෂකයින්ටත් මහත් වූ ප්‍රතිඵලයන් රාශියක් ළඟා කරගැනීමට හැකියාවක් ලැබේ. එහිදී මූලිකම වන්නේ මෙතෙක් අනාවරණය නොවූ විවිධ වූ වටිනා පුස්කොළ පොත් හා එකතුන් අනාවරණය කර ගැනීමට හැකි වීමයි. මෙසේ පුද්ගල සන්තකව හෝ විහාරස්ථාන ආශ්‍රය කරගෙන පවතින්නා වූ මෙම එකතුන් සංරක්ෂණය කිරීමට හැකිවීම මෙම ක්‍රමයේ පවතින්නාවූ ප්‍රධානතම වූ වාසිදායී ප්‍රථිපලයකි. කෙනෙකු සාහිත්‍ය ගවේෂණයේ යෙදේ නම් ඔහුට ආයාසයකින් තොරව අප වෙත පැමිණ

එක් ස්ථානයකදී බොහෝ තොරතුරු ලබා ගැනීමට හැකිවීම තවත් ගුණාත්මක වූ ප්‍රතිඵලයකි. එසේම පර්යේෂකයන්ගේ හා සාස්ත්‍රීය අධ්‍යයනයේ හෝ සංස්කරණ කාර්යයක නිරත වන්නා වූ පුද්ගලයින් හට මේ සංරක්ෂණ ක්‍රියාවලියෙන් ඉටු වන්නේ ඉමහත් පිටුවහලකි. පුද්ගලයින් හට අවශ්‍ය තොරතුරු ලබා දෙන සම්පත්දායක ආයතනයක් ලෙසින් ද අප ආයතනය ක්‍රියාත්මක වේ. මෙතෙක් පුස්කොළ ලේඛණවල දැනුම කඩදාසි මතට පැමිණියේ ක්‍රි.ව 1700 ගණන් වලින් පසුවය. එසේම දැන් එකී දැනුම කඩදාසියෙන් ඩිජිටල්කරණයට පැමිණ තිබේ. අප විසින් සිදු කරන්නේ මේ පුස්කොළ පොත්හි දැනුම ඍජුවම ඩිජිටල්කරණයට ලක් කිරීමයි. එනම් මාධ්‍ය නව්‍යකරණයේදී දැනුම ද නව්‍යකරණයට ගෙනයාමයි. මෙමගින් දේශිය ඥාණය නවීන තාක්ෂණය ඔස්සේ සංරක්ෂණය වීම සිදුවේ. එසේම පුස්කොළ පොත් පිළිබඳව සමාජයේ ඇති මිත්‍යා මෙන්ම සාම්ප්‍රදායික අදහස් හා ආකල්ප වලින් ඔබ්බට ගෙන යාමට හැකියාවක් මෙන්ම ආධුනිකයින්ට නව අවස්ථාවක් ද ලැබේ. එසේම මුද්‍රිත පිටපත් හා පුස්කොළ පිටපත් අතර ඇති ඉතා සියුම් විස්තර සහ දත්තයන් පවා පහසුවෙන් නිරීක්ෂණය කළ හැකි වීමත් මෙමගින් ලබන්නාවූ තවත් ගුණාත්මක වූ ප්‍රතිඵලයෙකි. උදාහරණ ලෙසින් රේඛාමය චිත්‍ර හා වර්ණ චිත්‍ර අක්ෂරවල හැඩයයන් විරාම ලක්ෂණ යනාදීය හොඳින් හඳුනා ගැනීමට හැකියාව ලැබීම දැක්විය හැකි ය. එසේම අදාළ මුල් පිටපත් ලබාගත් ස්ථානයේ එම එකතුවට හානී වීමක් හෝ විනාශ වීමක් සිදු වුවහොත් අප සන්තකව පවතින්නාවූ පිටපත් ඉතා හොඳින් සංරක්ෂණය වීම ඉතා වැදගත් වෙයි. මේ ඩිජිටල්කරණය වූ මූලාශ්‍රය විශ්වසනීය මූලාශ්‍රයක් ලෙසින් භාවිත කිරීමට කිසිඳු ගැටලුවක් නැත. අවශ්‍ය වේ නම් මේ පිටපත් වල මුද්‍රිත පිටපත් වුවද ලබා ගැනීමට හැකි වීම තවත් ප්‍රතිඵලයෙකි. අප විසින් මෙලෙස සංරක්ෂණය කරනු ලබන පුස්කොළ පොත් අවශ්‍ය වේලාවකදී අවශ්‍ය ලෙසින් ඍජුවම ගෙන බැලීමට ක්‍රමවේදයක් සකස් කිරීමටද හැකියාවක් ඇත.

**සාකච්ඡාව**

පුස්කොළ පොත් යනු වර්තමානයේදී කෞතුක භාණ්ඩයක් සේ පෙණුනද ඊටත් එහා ගිය වටිනාකමක් සහිත වූ භෞතිකමය වස්තුවකි. එහි වටිනාකම නම් මේ තුළ සජීවි දැනුම් සම්භාරයක් අඩංගු වී තිබීමයි. මේ දැනුම වඩාත් ආකර්ශනීය ලෙස වත්මන් පරපුරට දායාද කිරීමේ ක්‍රමයක් වශයෙන් මේ සංරක්ෂණ ක්‍රමවේදය හඳුන්වා දිය හැකිය. මේ ක්‍රමය දැනටමත් තායිලන්තය,ලාඕසය වැනි රටවල් හි භාවිත වේ.

**නිගමනය**

මේ අනුව සලකා බැලීමේදී පුස්කොළ පොත් යනු තව දුරටත් විහාරස්ථානවල හෝ රාක්ක වල සඟවා පුස්කමින් විනාශයට ලක්වන්නා වූ

කෞතුක වස්තූන් නොව අධ්‍යයන හා පර්යේෂණ කාර්යන්ට සහාය දක්වන සජීවි මූලාශ්‍රයන් බවට පත් කිරීම අපගේ අරමුණක් වෙයි. මෙවැනි කර්තව්‍යයක් සිදුකරන්නා වූ විශ්වවිද්‍යාල මට්ටමේ වන එකම හා පළමු ආයතනය අප ආයතනය විය යුතු ය. දැනට අප සතුව පුස්කොළ පොත් දහසකට ආසන්න ගණනක සංරක්ෂිත වූ පිටපත්ද පත්ඉරු ගණනින් සැලකුවහොත් පත්ඉරු ලක්ෂ දෙකකට ආසන්න සංඛ්‍යාවක්ද පවතී.

**මුඛ්‍ය පද** : පුස්කොළ පොත්, සංරක්ෂණය, තාක්ෂණය, ඩිජිටල්කරණය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

ලගමුව, ආරිය (2006). *ශ්‍රී ලංකාවේ පුස්කොල පොත් ලේඛණ කලාව.* කොළඹ: සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තුමේන්තුව.

ඇල්ලෙපොල, දීපාංජනී, (2007).*තල්පත් ලිවීම.* මධ්‍යම සංස්කෘතික අරමුදල. කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තුමේන්තුව

*ලංකාවේ අධ්‍යාපනය* (අධ්‍යාපන සියවස ග්‍රන්ථය) අධ්‍යාපනය හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශය.

කුමාරස්වාමි, ආනන්ද. *මධ්‍යකාලීන සිංහල කලා.* කොළඹ: කෞතුකාගාර දෙපාර්තුමේන්තුව.

රාහුල හිමි, වල්පොළ (2002). *ලක්දිව බුදුසමයේ ඉතිහාසය.* කොළඹ: ගොඩගේ ප්‍රකාශකයෝ.

පීරිස්, රැල්ෆ්, (2001). *සිංහල සමාජ සංවිධානය,(මහනුවර යුගය).* බොරලැස්ගමුව: විසිදුණු පොත් ප්‍රකාශකයෝ